www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ නියෝජිතයා ළමා සොල්දාදුවන් බඳවා ගැනීමට උදව්දීම පිළිබඳව ශ්‍රී ලංකාවේ මිලිටරියට චෝදනා කරයි

## UN envoy accuses Sri Lankan military of helping recruit child soldiers

**කේ. රත්නායක විසිනි**

**2006 නොවැම්බර් 20**

එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ඇලන් රොක්, මිලිටරිය කරුනා කන්ඩායම ලෙස හැඳින්වෙන සිය පැරා මිලිටරි සගයාට දෙමල ඊලම් විමුක්ති කොටින්ට (එල්ටීටීඊ) එරෙහිව සිවිල් යුද්ධ තුල සටන් කිරීමට ලමුන් බඳවා ගැනීම සඳහා උදව් උපකාර කර තිබේ යැයි චෝදනා කරමින් ශ්‍රී ලංකාවේ පාලක කවයන් තුල විශාල කලබැගෑනියක් අවුලුවා තිබේ.

මෙම ප්‍රකාශ එල්ටීටීඊයට එරෙහි ආන්ඩුවේ ජාත්‍යන්තර ප්‍රචාරක ව්‍යාපාරයේ එකී තීරනාත්මක මූලසාධකයක් ඛන්ඩනය කර දමයි. වසර ගනනාවක් තිස්සේ බලයට පත් කොලඹ ආන්ඩු ලමා සොල්දාදුවන් යොදා ගැනීම පිලිබඳව එල්ටීටීඊයට චෝදනා කරමින් සිටියහ. දූන් සන්නද්ධ හමුදා එම කාරනාව පිලිබඳව ම චෝදනා ලැබ සිටිති.

කඳු ගැසෙන තරමට සාක්ෂ්‍ය තිබියදී වුවත් මිලිටරිය විසින් තමන් කරුනා කන්ඩායම වැනි පැරා මිලිටරි කන්ඩායම් සමග සම්බන්ධකම් පවත්වන්නේ නැතැයි දිගින් දිගට ම තරයේ කියාපාමින් සිටීම නිසා මෙම චෝදනා පාලක පන්තියේ අපහසුතාවය දෙගුන කරයි. නැගෙනහිර අම්පාර-මඩකලපු දිස්ත්‍රික්කවල එල්ටීටීඊ සන්නද්ධ සටන්කරුවන් සැලකිය යුතු කොටසක් ද සමග කරුනා නොහොත් වී. මුරලිදරන් 2004 දී එල්ටීටීඊයෙන් බිඳී ගියේ ය.

ලමුන් හා සන්නද්ධ ගැටුම් පිලිබඳව එක්සත් ජාතීන්ගේ නියෝජිතයාගේ විශේෂ උපදේශක රොක් ශ්‍රී ලංකාව තුල දස දින කරුනු සොයා බැලීමේ මෙහෙවරක නිරත විය. පසු ගිය සඳුදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මුනගැසීමෙන් අනතුරුව ඔහු සිය සොයාගැනීම් ප්‍රසිද්ධියට පත් කලේ ය.

කරුනා කන්ඩායම සඳහා ලමයින් පැහැර ගැනීමේ දී මිලිටරියේ කොටස් උදව් දීම හා ඊට සහභාගි වීම ගැන "ශක්තිමත් සහ පිලිගත හැකි" සාක්ෂ්‍ය ඇති බව රොක් මාධ්‍යවලට පැවසී ය.

"ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් කරුනා කන්ඩායමට බඳවා ගනු පිනිස ලමයින් වට කර අල්ලාගෙන තිබේ", යයි ඔහු පැවසී ය.

ඇසින් දුටු සාක්ෂ්‍ය උපුටා දක්වමින් එක්සත් ජාතීන්ගේ නියෝජිතයා යුද හමුදාව ලමයින් අල්ලා ගෙන අලුතෙන් බඳවා ගැනීමට සුදුසු අය තෝරා ගැනීමට කරුනා කන්ඩායමට අවස්ථාව සලසා දීමේ සිද්ධියක් නැගෙනහිර දිස්ත්‍රික්ක තුල "ඔවුන්ගේ බලකායේ ප්‍රමානය වැඩි කර ගැනීමේ වේගවත් ව්‍යාපාරයක නිරතව සිටින කරුනා කන්ඩායම බලහත්කාරයෙන් පැහැර ගෙනයාම්වල ක්‍රියාශීලීව යෙදී සිටී" යයි ඔහු පැවසී ය.

කරුනා කන්ඩායමේ සාමාජිකයන් මිලිටරි මුර කපොලු හරහා ප්‍රසිද්ධියේ ආයුධ රැගෙන යමින් සහ ප්‍රචන්ඩ ක්‍රියාවල හා බියගැන්වීම්වල නිරත වෙමින් නැගෙනහිර දිස්ත්‍රික්කවල බාධාවකින් තොරව සැරිසරන බව රොක් වාර්තා කලේ ය. එක් සිද්ධියකදී පවුලක මව සිය දරුවා සමග බේරී පලා ගිය විට පැහැරගැනීමේ කන්ඩායමක් විසින් පියා අල්ලාගෙන තිබේ.

පොලීසිය පැහැරගැනීම් පිලිබඳ පැමිනිලි විමර්ශනය කර නැති බව නියෝජිතයා සොයාගෙන තිබේ. මේ ඔක්තෝබරය දක්වා බලහත්කාරයෙන් බඳවාගැනීම් සඳහා වන පැහැර ගැනීම් 164ක් යුනිසෙෆ් ආයතනය විසින් වාර්තා කර තිබෙන අතර ඇත්ත සංඛ්‍යාව මීට වඩා ඉහල විය හැකි බව ද ඔහු පැවසී ය. ලමා සොල්දාදුවන් නිදහස් කර යැවීමට වූ පොරොන්දුව ඉටු කිරීමට අසමත් වීම පිලිබඳව රොක් එල්ටීටීඊයට ද චෝදනා කල අතර ඔවුන් ඊට අනුව වැඩ කිරීමට පෙලඹවීම පිනිස ජාත්‍යන්තර පීඩනය යොදවන බවට අනතුරු ඇඟවී ය.

ඒවායේ සීමිත ස්වභාවය තිබියදී ම, රොක්ගේ චෝදනා කොලඹ ආන්ඩුවේ ඇමති නිලයකට පහර දී ඇත. ජනාධිපති රාජපක්ෂ 2002 සටන් විරාමය ප්‍රසිද්ධියේ අවඥාවට ලක් කරමින් හා එල්ටීටීඊයට එරෙහිව මිලිටරි ප්‍රහාර මාලාවක් දියත් කරමින් සිටින අතරේ ම මහ බලවතුන් තමන්ගේ පැත්තේ තියාගැනීම පිලිබඳව බොහෝ විමසිලිමත් ය. කවර හෝ ජාත්‍යන්තර විරසක වීමක් වලක්වා ගැනීමට උත්සුකව සිටිනා ඔහු

රොක්ගේ චෝදනා "පූර්නව විමර්ෂනය කර වරදකරුවන්ට දඬුවම්" කරන බවට පොරොන්දු විය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මිලිටරිය රොක්ගේ ප්‍රකාශයෙන් "ඒවායේ බැරෑරුම් ස්වභාවය සහ ඉන් ඇති කරන අනිෂ්ඨ ප්‍රතිවිපාකවල දෘෂ්ටියෙන් ඒවා ඇසීම පිලිකුල් කල යුතු අතර ඔහුගේ ප්‍රකාශයන් සම්බන්ධව හේතු දැක්වීමක් අවශ්‍ය" බව පවසමින් වහාම එම ප්‍රකාශයන් හෙලා දක්කේ ය. එම ප්‍රකාශය තව දුරටත් මෙසේ ද පැවසී යː "එල්ටීටීඊ ප්‍රචන්ඩත්වය පාලනය කිරීමටත් කලාපයේ මානව හිමිකම් ආරක්ෂා කිරීමටත් නැගෙනහිර මඩකලපුවේ ආන්ඩුවේ පාලන ප්‍රදේශවල යොදවා තිබෙන ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා බලකායන්ට දෝෂාරෝපනය කිරීමට (එජා) නියෝජිතයන් වක්‍රෝත්තියෙන් අමතර දුරක් ගොස් ඇති බව රහසක් නොවේ."

මිලිටරිය කට ඇරීමෙන් අනතුරුව සිය තාලය වෙනස් කල රාජපක්ෂ මෙසේ පවසමින් ප්‍රකාශයක් නිකුත් කලේ යː "කොහොම නමුත් නියෝජිත රොක් ප්‍රසිද්ධියට පත් කල සමහර නිගමනයන් සටන්කරුවන් ලෙස ලමයින් බඳවා ගැනීම කිසිසේත් නොඉවසන දිගුකාලීන වූ ආන්ඩුවේ පිලිවෙතට විරුද්ධව බොහෝ විකෘති මාධ්‍ය වාර්තාවන්ට මග පෑදීම පිලිබඳ ආන්ඩුව කනගාටු වෙයි."

ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මිලිටරිය ආරක්ෂා කරමින් සහ නැගෙනහිර සිද්ධිය වූ තැන පැය කීපයක් පමනක් ගතකිරීමෙන් අනතුරුව "පිලිගත හැකි" තොරතුරු එක් රැස් කර ගැනීමට වූ රොක්ගේ සමර්ථය ප්‍රශ්න කරමින් බ්‍රහස්පතින්දා පුවත්පත් සාකච්ඡාවක් පැවැත්වී ය. කැපීපෙනෙන ලෙස, අනෙකුත් නිල ප්‍රකාශකයන් මෙන් ම රඹුක්වැල්ල ද ලමුන් බඳවා ගැනීමේ යුද හමුදා සම්බන්ධය සම්පූර්නයෙන් ප්‍රතික්ෂේප නොකලේ ය.

සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන ද (ජවිපෙ) රොක්ව හෙලා දුටුවේ ය. ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ සාක්ෂ්‍ය නැති බව හා "ලමයින් බඳවා ගැනීම පිලිබඳව එල්ටීටීඊයේ නරක නාමය ශුද්ධ කිරීමට රටට ඒම" පිලිබඳව ඔහුට චෝදනා නැගී ය. මෙම පක්ෂය කරුනා පාර්ශ්වය සමග සමීප සබඳතා පවත්වන අතර ජවිපෙ පුවත්පත වන ලංකා හි ඔවුන්ගේ පුහුනු කඳවුරු පිලිබඳව ලිපි හා ඡායාරූප පලවී තිබේ.

රොක්ගේ විමර්ශනය ඉදිරිපත් කෙරෙන්නේ කරුනා කන්ඩායම සමග යුද හමුදාවේ සබඳතා පිලිබඳව වෙනත් සාක්ෂ්‍යවලින් පසුව ය. ශ්‍රී ලංකා සටන් විරාම කමිටුවේ (එස්එල්එම්එම්) ප්‍රකාශිකා හෙලන් ඔල්ස්ෆ්ඩොටිර් පසු ගිය සතියේ දී සිය සටන් විරාම නිරීක්ෂකයන් කරුනා කන්ඩායෙමේ උදව්කරුවන් "ශ්‍රී ලංකා හමුදා කඳවුරු තුලට යනු හා ඉන් පිටවනු" නිරීක්ෂනය කර තිබෙන බව තහවුරු කලා ය. "වාර්තාවූ සිද්ධීන්ගේ (ලමුන් පැහැර ගැනීමේ) බහුතරය එල්ටීටීඊයට එරෙහිව නොව කරුනා කන්ඩායමට එරෙහිව" බව මැයි 29 සිට අගෝස්තු 31 දක්වා ආවරනය වන ඔවුන්ගේ වාර්තාවේ එස්එල්එම්එම් ය සඳහන් කරයි.

කරුනා කන්ඩායම වැනි පැරා මිලිටරියන් සමග මිලිටරියේ සහයෝගීතාවය හුදෙක් ලමුන් පැහැර ගැනීම පිලිබඳව කාරනාවක් නො වේ. මිලිටරි ඔත්තු සේවාවන් දිගු කලක් තිස්සේ එවැනි සංවිධාන සිය නින්දිත ම වැඩ කටයුතු කිරීමට යොදවා ගනිමින් සිටී. පසු ගිය නොවැම්බරයේ රාජපක්ෂ බලයට පත් වූ තැන සිට ප්‍රමුඛ එල්ටීටීඊ හිතවතුන් කුපිතකාරී ලෙස මරා දමුන උත්සන්න වූ රහස් යුද්ධයක් දිවයිනේ උතුරේ සහ නැගෙනහිර පවතී.

නොවැම්බර් 10 දා එල්ටීටීඊ හිතවාදී පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහ දවල් කොලඹදී වෙඩි තබා මරා දැමුනි. ඝාතනය සිදු වූ ප්‍රදේශය මිලිටරි කඳවුරුවලට හා පොලිස් ස්ථානවලට සමීපයේ වූ නමුත් නවතා තිබූ යතුරු පැදියකින් ආරක්ෂක හමුදා මගහැර යාමට ඝාතකයා සමත් විය. ජූලි මාසයේ යුද හමුදාව සහ එල්ටීටීඊය අතර විවෘත ගැටුම් පුපුරා යාමෙන් අනතුරුව බොහෝ මාර්ග බාධක හා මුර කපොලු සහිත අගනුවර දැඩි ආරක්ෂාව යටතේ පවතී.

2002 සටන් විරාමයට අනුව ආන්ඩුවේ පාලන ප්‍රදේශවල ක්‍රියාත්මක පැරා මිලිටරි කන්ඩායම් හමුදාව විසින් නිරායුධ කල යුතු යයි එල්ටීටීඊය දිගින් දිගට ම කියා සිටියේ ය. පෙබරවාරියේ ජිනිවා සාම සාකච්ඡාවල දී ආන්ඩුව සටන් විරාමය ක්‍රියාවට දැමීමට පොරොන්දු වූ නමුත් මිලිටරිය එසේ කිරීමට අසමත් විය. ඔවුන්ගේ නිදහසට දක්වන කාරනා තුනීයට ආවරනය වූ මුසාවන් හැර අන් යමක් නො වේː එනම්, එක්කෝ කරුනා කන්ඩායම ආන්ඩු ප්‍රදේශවල ක්‍රියාත්මක නොවේ නැතිනම් මිලිටරිය එසේ කිරීමට අසමත් ය යන හේතුය.

ඇත්ත වසයෙන්ම නම්, මිලිටරි ඉහල නිලධාරින්ගේ කොටසක් කරුනා බිඳී යාම, දිවයිනේ නැගෙනහිර විශේෂිතව, දුර්වල වූ එල්ටීටීඊයට එරෙහිව ප්‍රහාරයට යාමට අවස්ථාවක් ලෙස දුටුවේ ය. මිලිටරි ඔත්තු සේවය කොලඹ ආරක්ෂිත නිවසක් තුල දී කරුනා සමග සාකච්ඡා මාලාවක් පැවැත්වූ බවට සාක්ෂ්‍ය 2004 එලියට ආවේ ය.

වර්තමානයේ නැගෙනහිර සිදුවන ප්‍රහාරයන්වල දී එල්ටීටීඊයට පහර දීමේදී මිලිටරිය හා පැරා මිලිටරි කන්ඩායම් සමීපව එකට වැඩ කර තිබේ. මෙම ක්‍රියාවන්හි දී තුවක්කු බත් සඳහා කරුනා කන්ඩායම වෙනුවෙන් ලමුන් පැහැර ගැනීමේ දී යුද හමුදාව උදව් කරනු ඇතැයි යන්න විශ්වාස කිරීමට ඇති තරම් හේතු තිබේ.